# කන්ද උඩරට ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකාවේ අවසාන රාජධානිය වූ කන්ද උඩරට, අනුරාධපුර රාජධානියට පසු දීර්ඝතම කාලක් පැවති රාජධානිය වේ. උඩරට පහසුවෙන් හඳුනාගත හැක්කේ දිවයිනේ මැද පිහිටි කඳුකර ප්‍රදේශය වශයෙනි. මෙම භූමි ප්‍රදේශය අනුරාධපුර යුගයේ දී හැඳින්වූයේ කඳුරට යන අර්ථය දුන් "මලෙයි" යන දෙමළ වචනයෙන් බිඳී ආ මලය දේශ, මලය මණ්ඩල, මලය රට සහ මලයාණ්ඩු වශයෙනි. බ්‍රාහ්මී ශිලාලේඛන විග්‍රහකර බැලීමේදී මහනුවර සහ එහි උපනගර ක්‍රිස්තුවර්ෂයාරම්භය වනවිට ජනාවාස ව පැවති ආකාරය වේගිරිය, දූල්වල, මොලගොඩ, ගොනවත්ත සහ බඹරගල යන ස්ථානවල ඇති ශිලාලේඛනවලින් පැහැදිලි වේ. එම තොරතුරු මගින් අවබෝධ වන්නේ සෙංකඩගලපුර රාජධානිය දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියනු ලබන බවයි.

දාහතරවැනි සියවසේ පමණ සිට ගම්පොළ සහ රයිගම පැවති ප්‍රධාන පාලන ඒකක දෙකක පිහිටි මධ්‍යස්ථාන එකිනෙකින් වෙන්කර හැඳින්වීමේ අවශ්‍යතාව නිසා පිළිවෙළින් ඒවාට උඩරට සහ පහතරට යන යෙදුම් භාවිත කර ඇත. ස්වාධීන රාජ්‍යයක් ලෙස හැඩ ගැසෙමින් පැවති අවධියේදී මේ පෙදෙස සඳහා සෙංකඩගලපුර, ශ්‍රී වර්ධනපුර, හෙවත් සිරිවර්ධනපුර හා කටුපුලුනුවර යනාදී නම් කිහිපයක් ව්‍යවහාර කර තිබේ. මහනුවර රාජධානිය ඇති වූයේ සෙංකඩගල ශ්‍රී වර්ධනපුරය මුල්කොට ගෙන ය. දාහත්වැනි සහ දහඅටවැනි සියවස් වන විට තවත් ප්‍රදේශ මෙම රාජධානියට අයත් වූ බව පෙනේ. පාතබුලත්ගමද උතුරෙන් නුවරකලාවිය හා තමන්කඩුව ඇතුලු වන්නි ප්‍රදේශ ද නැගෙනහිරින් තම්පලගම් පත්තුව හා පානම ඇතුලු ප්‍රදේශ ද දකුණින් ඌව සහ සබරගමුව යන ප්‍රදේශ ද එකතුවීමෙන් බෙහෙවින් විශාල වී තිබුණි. දහඅටවැනි සියවස වන විටදී උඩුනුවර ප්‍රදේශයට යාබදව එහි වම්පසින් ඉහලබුලත්ගමත් ඊට දකුණු පසින් උඩපළාත නමින් හඳුන්වන ලද පෙදෙසක් පිහිටා තිබුණි. තවද හාරිස්පත්තුවට යාබදව තුන්පනේ ද හේවාහැටට වම්පසින් කොත්මලේ ද ඊට දකුණු පසින් වලපනේ ද යනුවෙන් එකී තවත් සීමාවන් දක්නට ලැබුණි. විශේෂයෙන් ම ක්‍රි.ව. 1815 ඉංග්‍රීසින් උඩරට ස්වකීය අනසකට යටත් කරගන්නා සමයේ සත් කෝරළය, සතර කෝරළය, ඌව, වලපනේ, උඩපළාත, නුවර කලාවිය, මාතලේ, සබරගමුව, තුන් කෝරළය, වෙල්ලස්ස, බින්තැන්න, තමන්කඩුව, උඩුනුවර, යටිනුවර, හේවාහැට, උඩබුලත්ගම, කොත්මලේ, හාරිස්පත්තුව, දූම්බර සහ පාතබුලත්ගම යනාදී ප්‍රදේශ මහනුවර රාජධානියට අයත්ව තිබුණි. මේ අනුව තහවුරු වන්නේ කන්ද උඩරට පස්රටට අයත් වූ ප්‍රදේශ කලින් කලට වෙනස්වී පැවති බවයි.

ස්වභාවික ව පිහිටි ආරක්ෂක රැකවල්වලින් සමන්විත මෙම රාජ්‍යයේ පිහිටීම රජ දරුවන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් විය. මෙම ප්‍රදේශය එකල වැදගත් වූයේ පරසතුරු ආක්‍රමණවලට උතුරු රාජධානිය යටත් වූ අවස්ථාවලදී ඒ සතුරන්ට විරුද්ධව සිංහලයන් ගෙනගිය ව්‍යාපාරවලට රැකවරණය සලසා දුන් ප්‍රදේශයක් ලෙසය. වියවුල් සහගත කාලසීමාවන්හි දී රජදරුවන්ට සතුරන්ගෙන් මිදී රැකවරණය ලබාගැනීමටත් සිය බල මුළු යළිත් සංවිධානය කරගැනීමටත් හේතු වූ නිසා මෙම ප්‍රදේශය ඔවුන්ට පිහිටාධාර විය. රාජ්‍යයක භෞමික පිහිටීම එහි ආරක්ෂාව තහවුරුවීම පිණිස බෙහෙවින් උපකාරී විය. විශේෂයෙන් ම උඩරට රාජ්‍යය කෙරෙහි අවධානය යොමු කරන විට මෙම සංකල්පය වඩාත් පැහැදිලි වේ. උඩරට රාජධානියේ පැවති ස්වභාවය ගැන කරුණු දැක්වූ රොබට් නොක්ස් මෙසේ පවසයි. "කන්ද උඩරට රාජධානිය ස්වභාව ධර්මයාගේ පරිත්‍යාගය සම්බන්ධයෙන් විශිෂ්ට සාධකයෙකි. එය සතුරෙකුට ප්‍රවේශ විය නොහැකි ලෙසත් පරසතුරෙකු විසින් බිඳහෙලිය නොහැකි ලෙසත් පර්වත, ප්‍රකාර සහ වලවල්වලින් හාත්පසින් ම වටවූවා වැන්න." මහනුවර රාජධානියේ ආරක්ෂිත පිහිටීම මෙම ප්‍රකාශයෙන් පැහැදිලි වේ. මධ්‍යම කඳුකරයේ මහනුවර නැගෙනහිරින් උතුරින් සහ බටහිරින් ස්වභාවික වශයෙන් මහවැලි ගඟින් වටවී ඇත. මහවැලි ගංගාව මහනුවර සානුව හරහා ගමන් කරයි.

හන්තාන කඳු පන්තිය උඩරට රාජධානියට මුරකාවල් සහිත බලකොටුවක් වූ අතර ආක්‍රමණිකයෙකුට පහසුවෙන් ළගාවීමට නොහැකි විය. මෙයට ප්‍රවේශවීම සඳහා පැවති ගිරිදුර්ග විමසීමේදී බටහිරින් බලන කපොල්ල සහ කඩුගන්නාව දුර්ගයත්, වයඹ දෙසින් ගලගෙදර දුර්ගයත්, උතුරින් බලකඩුව දුර්ගයත් පිහිටා ඇත. රාජ්‍යයට දකුණු දෙසින් හැටන් සානුව හරහා පැමිණීමට පෙර ගිනිගත්හේන කපොල්ල භාවිත කිරීම අනිවාර්ය විය. මෙම ආරක්ෂක කපොලු තරණය කිරීම බොහෝ දුරට ආගන්තුක පිරිසකට තරමක් දුෂ්කර ය.

උඩරට පැවති ස්වභාවික රැකවරණය තුළ ආරක්ෂාව සපයාගත් හෙළ රජ දරුවන් සිටි බව පෙනේ. පළමුවෙන් ම අභය සොයා ගියෙකු ලෙස වංශකථාවල අසන්නට ලැබෙන්නේ දුටුගැමුණු රජතුමා (ක්‍රි.පූ. 161-137) ගැන ය. ඔහු පිය රජුගේ කෝපයෙන් බේරීමට මලය රට පාමුල කොත්මලේ ලැගුම් ගත්තේය. චෝළ රජුන්ගේ ග්‍රහණයෙන් ශ්‍රී ලංකාව මිරිකුණු සමයෙහි වට්ටගාමිණී අභය (ක්‍රි.පූ. 103-89) වැඩිකාලයක් වාස භූමි කර ගත්තේ කන්ද උඩරටයි. කැළඹිලි සහිත කාලවකවානුවලදී අනුරාධපුරයේ සිටි රජවරු කඳුරට තම වාසය සඳහා තෝරාගත්තේය. ඒ රජවරුන් අතර සිලාකාල (ක්‍රි.ව. 518-531), හයවෙනි අග්බෝ (ක්‍රි.ව. 732-772), දප්පුල (ක්‍රි.ව. 815-831) වැනි අය ද පොළොන්නරු යුගයේ සිටි පළමුවන විජයබාහු (ක්‍රි.ව. 1055-1110) ද වෙති.

සේනාසම්මත වික්‍රමබාහු අඩ සියවසකටත් අධික කාලයක් පහතරට යටතේ වූ උඩරට රාජ්‍යය ඒ තත්ත්වයෙන් මුදා පූර්ණ ස්වාධීන රාජ්‍යක් බවට පත් කළේය. මෙම රජතුමා පිළිබඳව ප්‍රථම වරට අනාවරණය කරන ලද්දේ කොඩ්රිංටන් විසිනි. ඔහු විසින් සේනාසම්මත වික්‍රමබහුගේ ශිලා ලිපි සහ සන්නස් පරීක්ෂා කර, ඒ රජුගේ රාජ්‍යෝදයත්, කෝට්ටේ 06 වන බුවනෙකබාහු රජුගේ රාජ්‍යෝදයත් එක් වකවානුවක් සේ සලකා, ක්‍රි.ව. 1473 බලයට පත් වූ බව විශ්වාස කෙරේ. නව උඩරට රාජ්‍යයේ අගනුවර වශයෙන් තෝරාගන්නා ලද්දේ සෙංකඩගල නුවරයි.

සේනාසම්මත වික්‍රමබාහුගෙන් අනතුරුව ජයවීර (ක්‍රි.ව. 1511- 1551) සිහසුනට පත් විය. මොහුගේ රාජ්‍ය සමය අර්බුදවලින් සමන්විත වූ බව පෙනේ. එවකට කෝට්ටේ හා සීතාවක රජවරුන් වූ බුවනෙකබා හා මයාදුන්නේ රජවරු කන්ද උඩරට දුර්ගස්ථාන අල්ලාගෙන යුද වැදීම ඊට ප්‍රධාන ලෙස බලපෑවේ ය. ඉන් බියට පත් ජයවීර, පෘතුගීසි ආරක්ෂාව ලබාගෙන කතෝලික ආගම වැළඳ ගත්තේය. ජයවීර රාජ්‍ය සමයේදී රජ පවුල තුළ කැරැල්ලක් පැන නැගුණි. කැරැල්ලෙන් ප්‍රයෝජන ගත් කරල්ලියද්දේ පෘතුගිසි ආධාරයෙන් නගරය යටත්කර ගත් අතර ජයවීර ඔටුන්න හා අනෙකුත් භාණ්ඩ ද රැගෙන ගොස් සීතාවක මායාදුන්නේගේ ආරක්ෂාව පැතුවේ ය.

කරල්ලියද්දේ බණ්ඩාර (ක්‍රි.ව. 1511-1581) උඩරට පාලකයා විය. මොහුට ද සාමන්ත පාලකයන්ගේ බලපෑමෙන් මිදීමට නොහැකි වූ බව පෙනේ. පිය රජු මෙන් කතෝලික ආගම වැළඳගෙන ක්‍රියාකිරීමත් සමග බෞද්ධ ජනතාවගේ විරෝධය හට ගත්තේය. නොසන්සුන් වාතාවරණයෙන් ප්‍රයෝජන ගත් පළමුවන රාජසිංහ ක්‍රි.ව. 1578 දී උඩරට අක්‍රමණය කර කරල්ලියද්දේ සිහසුනෙන් පහ කළේය. මොහුගේ පාලන සමයේ මහනුවරට උදා වූයේ අඳුරු කාලපරිච්ඡේදයකි. බෞද්ධාගමේ අභිවෘද්ධිය පැතූ උඩරටියෝ රාජසිංහයන් ශිවාගම වැළඳගැනීමත් බෞද්ධ සිද්ධස්ථාන ආඩිගුරුන්ට ලබාදීමත් පිළිබඳ කණගාටු වූහ. රාජසිංහයන් ගෙන ගිය කෲර පාලනයෙන් බැට කෑ උඩරට ජනතාව අවස්ථා කිහිපයකදී ම කැරලි ගසන ලදි. එසේ කැරලි ගැසූ අය අතර වීරසුන්දර සහ දොන් ප්‍රැන්සිස්කු මුදලි යන අය පෙන්වා දිය හැකිය.

මෙම යුගයේ වෙරළබඩ තීරයේ බලය ගොඩනගාගෙන සිටි පෘතුගීසීන් උඩරට අස්ථාවර දේශපලන කටයුතු කෙරෙහි අවධානය යොමු කළ බව පෙනේ. එනිසා ඔවුන් විසින් උඩරටට විරුද්ධව සේනාවක් මෙහෙය වන ලදී. මෙම ආක්‍රමණයෙන් පරංගීන් අපේක්ෂා කළේ උඩරට කතෝලිකාගම වැළඳගත් පෘතුගීසි පාක්ෂික රජෙකුහට භාරදී එය අතවැසි රාජ්‍යයක් බවට පෙරළීම යි. මෙම අපේක්ෂාව පෙරදැරි කරගැනීම සඳහා ඔවුන් යොදා ගත්තේ දොන් පිලිප් යමසිංහ බණ්ඩාර සහ කොනප්පු බණ්ඩාර යි. කොනප්පු බණ්ඩාර ක්‍රි.ව. 1591 උඩරට රාජ්‍ය බලය සියතට ගත්තේය. හෙතෙම පළමුවන විමලධර්මසූරිය නමින් රජු බවට පත්වීම නව පෙළපතක ආරම්භය ලෙසත් ප්‍රබල මහනුවර රාජ්‍යයේ නව කාල පරිච්ඡේදයක් ද එමගින් සනිටුහන් විය. නිත්‍යානුකූල රාජ උරුමය දෝනකතිරිනා සතු වූ නිසා ක්‍රි.ව. 1594 පෙරෝ ලෝපේස් ද සූසාගේ නායකත්වයෙන් ප්‍රබල ආක්‍රමණයක් එල්ල කර ඇත. දෙපාර්ශ්වය අතර දරුණු සටනක් දන්තුරේ වෙල්යායේ දී සිදුවූ අතර එමගින් පෘතුගීසින්ට අන්ත පරාජයක් අත් විය. පළමුවන විමලධර්මසූරිය රජතුමා දෙල්ගමුවේ පැවති දළදා වහන්සේ වැඩම කරවා, අභිනව දළදා මැඳුරක් ඉදිකර උඩරට බෞද්ධ ජනතාවගේ පක්ෂපාතීත්වය දිනා ගත්තේය. මෙම පාලන වකවානුව උඩරට රාජධානි සමයේ වැදගත් කාල පරිච්ඡේදයකි.

විමලධර්මසූරියගේ මරණයත් සමඟ උඩරට රාජ්‍ය බලය ලබාගැනීමට ඉදිරිපත් වූ සෙනරත් රජු (ක්‍රි.ව. 1604-1635) කිරුළේ උරුමය තහවුරු කර ගත්තේ කුසුමාසන දේවිය නිසාය. බෞද්ධ ස්ථවිර නමක් ලෙස ජීවත්වෙමින් ම දෝන කතිරිනා කුමාරිය විවාහ කොට ලක් රජය කළ බව රොබට් නොක්ස් පවසයි. මෙම රාජ්‍ය සමය සාමකාමී අවධියකි. ඊට හේතුව වූයේ ක්‍රි.ව.1617 දී රජු සහ පෘතුගීසින් අතර ඇති වූ ගිවිසුම මගින් උඩරට ප්‍රදේශ ආක්‍රමණය කිරීම වළක්වා තිබීම යි. මහලු වියට පත් සෙනරත් රජු ක්‍රි.ව.1629 දී පමණ මහනුවර රාජ්‍ය තම පුතුන් තිදෙනා වන විජයපාලට(මාතලේ) කුමාරසිංහට (ඌව පළාත) රාජසිංහට (මහනුවර) බෙදා දුන්නේ ය. සෙසු සොහොයුරන් අභිබවා රාජසිංහ ඉදිරියට පැමිණියේ ය. ඔහු මහා අස්ථාන හෙවත් දෙවන රාජසිංහ (ක්‍රි.ව.1635-1687) නමින් උඩරට රජු බවට පත්වීම ලංකා ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවකි. දෙවන රාජසිංහ පෘතුගීසින් මෙරටින් නෙරපා දැමීමේ වටිනාකම වටහාගෙන ඒ සඳහා ලන්දේසීන්ගේ ආධාර ලබාගැනීමට කැලිකට්හි ලන්දේසි ආණ්ඩුකාරවරයාට දැන්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස බතාවියාවේ ඕලන්ද නැගෙනහිර ඉන්දියානු සමාගමේ අධ්‍යක්ෂක විසින් රජු සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීමට වෙස්ටර් වෝල්ඩ් මෙහි එවන ලදි. මෙසේ ගොඩනගා ගත් ලන්දේසි සබඳතාවල අවසාන ප්‍රතිඵලය වූයේ පෘතුගීසි ජාතිකයින් මුළුමනින් ම පලවා හැරීමට දෙවන රාජසිංහට හැකි වීමයි. එමෙන්ම යුරෝපා ජාතීන්ගේ ආක්‍රමණවලට උපක්‍රමශීලී ව මුහුණ දුන් මහනුවර සිටි ප්‍රබලතම පාලකයා ද වශයෙන් ඒ රජු සඳහන් කළ හැකිය.

දෙවන රාජසිංහගේ මරණයෙන් පසු දෙවන විමලධර්මසූරිය (ක්‍රි.ව.1687-1707) රාජ්‍යත්වයට පත් විය. මොහු සාමකාමී රජ කෙනෙකි. තම පියාගේ කාලයේ අතපසු ව ගිය ආගමික කටයුතු කෙරෙහි සිය අවධානය යොමු කළේය. ලන්දේසීන් හා මිත්‍රත්වයෙන් සිටීමට ද මේ රජතුමා මහන්සි ගත්තේය. රජුගේ අනුග්‍රහය සහිතව කන්ද උඩරට රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීමක් දක්නට ලැබුණි. ඒ රජුගේ ඇවෑමෙන් ඔහු පුත් කුණ්ඩසාලේ කුමරු ක්‍රි.ව. 1707 දී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ නමින් රාජ්‍යත්වයට පත් විය. එවකට සිටි කිසිදු රදළ ප්‍රධානියෙකුගේ අනුමැතියෙන් තොර ව පෙර රජුන් මෙන් මදුරා පුරයෙන් මෙහෙසියක වූ උඩුමාලේ දේවිය ගෙන්වා ගැනීමත් සමග රාජ සභාවෙහි නොසන්සුන්තාවයක් හට ගත්තේය. මෙම සිදුවීමෙන් පසු උඩරටට උදා වූයේ අඳුරු දසාවකි. මහනුවර රාජධානියේ සිංහල සහ හින්දු සම්භවයක් සහිත පාලකයන් බිහිවන්නේ මෙතැන් සිටය. ශාසනික අභිවෘද්ධිය හෝ රණශූරත්වය මොවුන් තුළින් නිරූපණය නොවීය. නරේන්ද්‍රසිංහගේ මරණයත් සමග කෙළවර වූයේ සේනාසම්මත වික්‍රමබාහුගෙන් ඇරඹුණු රාජවංශය පමණක් නොව මෙතෙක් අඛණ්ඩව පැවති සිංහල රාජාවලිය යි.

අවසන් සිංහල රජුගෙන් අනතුරුව බලයට පත්වන ශ්‍රී විජය රාජසිංහ (ක්‍රි.ව. 1739 - 1747), කීර්ති ශ්‍රී රාජසිංහ (1747-1981), රාජාධි රාජසිංහ (ක්‍රි.ව. 1781-1798) සහ ශ්‍රී වික්‍රම රාජසිංහ (ක්‍රි.ව. 1798-1815) යන සිව් දෙන ජන්මයෙන් ස්වදේශික පිරිසක් නොවූහ. දකුණු ඉන්දියානු ආන්ද්‍ර ප්‍රදේශයෙන් පැමිණි බව කියැවෙන මොවුහු මදුරා, තන්ජෝර් හා තිරුවිතාපොලී වැනි ප්‍රදේශවල පාලකයින් ලෙස කටයුතු කළ පිරිසක් වූහ. මදුරාපුර රාජවංශිකයින් ලෙසට පමණක් නොව සූර්ය වංශයට අයත් පිරිසක් ලෙස ද සැලකේ. ඔවුන් නායක්කර් වංශිකයෝ ලෙස ද තවත් විටෙක වඩුගයෝ ලෙස ද හැඳින්වති. විදේශීය රාජවංශයකට අයත් වූ මෙම පිරිස ජනතාවගේ සිත් සතන් දිනාගෙන වසර 76 ක් පමණ කන්ද උඩරට රාජ්‍යයේ පාලන බලය දිනාගැනීමට හැකි විය.

වර්ෂ 1798 ජුලි මාසයේදී රාජාධිරාජසිංහ රජුගේ මරණය සිදුවිය. මේ කාලය වනවිට කන්ද උඩරට රාජ සභාවේ සිංහල - නායක්කර් භේදය තදින් පැන නැඟී තිබුණි. වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ පටන් එතෙක් උඩරට රාජධානියෙහි පිළිගෙන තිබුණු සම්ප්‍රදාය අනුව නම් මිළඟට රජකම හිමිවිය යුතුව තිබුණේ රාජාධිරාජසිංහ රජුගේ බිසවගේ සොහොයුරා වූ මුත්තුසාමි නම් කුමාරයාට ය. නමුත් මහාදිකාරම් වූ පිළිමතලව්වේ විසින් රාජාධිරාජසිංහ රජුගේ සහෝදරයාගේ පුතෙකු වූ කන්නසාමිට රජකම ලබාදීමට ක්‍රියා කළේය. අදිකාරම්ගේ අභිමතය පරිදි කන්නසාමි කුමරු රජු බවට පත්කිරීමෙන් පසු තමන්ට කිරුළ දැරීමේ බලාපොරොත්තුව ඇතිව හෝ නැතහොත් ශ්‍රී වික්‍රම රාජසිංහ රජෙකු වශයෙන් සිහසුනේ තබා රාජ්‍ය බලය ලබා ගැනීමේ අරමුණින් ක්‍රියා කළේය. මෙම සිදුවීමත් සමග අවසානයේ මුත්තුසාමි ඉංග්‍රිසින් වෙත පළා ගියේය. රජකමට සුදුසුකමක් හෝ පළපුරුද්දක් නොතිබුණු අවුරුදු 18 ක ළාබාලයකු රජකමට පත්වීමෙන් අර්බුද ගණනාවක් පැනනැගුණි. *උඩරට රාජධානිය* කෘතියේ සඳහන් පරිදි පිළිමතලව්වේගේ පෞද්ගලික අභිමතයන් සපුරාගැනීමේ අරමුණින් ක්‍රියා කිරීමත් සමග රාජසිංහ සහ පිළිමතලව්වේ වටා පිල් බෙදීමක් ඇතිවිය. මෙම බෙදීම උඩරට රාජධානියේ පරිහානියට සෘජු වශයෙන් ඉවහල් වූ බව පෙනේ.

වෙරළබඩ තීරයේ ආධිපත්‍යය ක්‍රමිකව ගොඩනැගූ ඉංග්‍රිසින් අනතුරුව අවධානය යොමු කළේ කන්ද උඩරට රාජ්‍යය සියතට ලබාගැනීම සඳහා ය. තම බලය ශ්‍රී ලංකාව තුළ ස්ථාවර කරගැනීමට නම් උඩරට බලය ද අත්‍යාවශ්‍ය විය. රජු තුළින් පිළිමතලව්වේගේ අරමුණු ඉටු නොවුණු නිසා බ්‍රිතාන්‍යයන් සමග මිත්‍ර සබඳතා ඇතිකරගැනීමට උත්සාහ ගත්තේය. ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා සමග පිළිමතලව්වේ ඇතිකරගත් එකඟතාවට අනුව, උඩරට රජුගේ ජීවිතයට හානිකොට තමන් සිංහාසනාරූඪ වීමට ආණ්ඩුකාරවරයාගේ උපකාර ලැබුණහොත් ඉංග්‍රීසි ජාතිකයන්ට රටේ ආධිපත්‍යය ලැබෙන සේ ක්‍රියා කිරීමට හෙතෙම පොරොන්දු විය. පැවති පසුබිම අවබෝධකරගත් ආණ්ඩුකරු උඩරට ආක්‍රමණය කිරීමට යෝග්‍ය බව තීරණය කරන ලදී. ක්‍රි.ව. 1803 දී උඩරටට එල්ල කළ ආක්‍රමණය හුදෙක් පිළිමතලව්වේගේ කපටිකමත්, ෆ්‍රෙඩ්රික් නෝර්ත්ගේ මෝඩකමත් නිසා ඇති වූ බව ජී.ඩී. මෙන්ඩිස් මහතා පවසයි. මෙම ආක්‍රමණයට මුහුණදීමට නොහැකි වූ රජු ආරක්ෂාව පතා හඟුරන්කෙතට ගිය බැවින් අත් අඩංගුවට ගැනීමේ ප්‍රයත්නය අසාර්ථක විය. අවසානයේ උඩරට පැවති භූගෝලීය සාධක සහ දේශගුණික තත්ත්වයන් කිසිවක් නොදත් බ්‍රිතාන්‍යයන්ට අන්ත පරාජයක් ලැබුණි.

ෆ්‍රෙඩ්රික් නෝර්ත්ගේ සේවා කාලයෙන් පසුව ක්‍රි.ව.1805 දී තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා ලෙස බලයට පත්විය. අවි බලයෙන් උඩරට ඇල්ලීමේ ක්‍රියාවලිය නවතා දැමූ ඔහු කාහටත් නොපෙනෙන පරිදි උඩරට රාජ්‍යයේ අත්තිවාරම බිඳීමේ ප්‍රතිපත්තියක් ගෙන ගියේය. මෙම කාර්යය ඉටුකරගැනීම සඳහා ජෝන් ඩොයිලිගෙන් ඉටුවූ මෙහෙවර ඉතා වැදගත් වේ. හෙතෙම සිංහල භාෂාව කථාකිරීමට හැකි සිංහල උගතුන් හා කපටි ලෙස ආශ්‍රය කළ බව පෙනේ. සිංහල සංස්කෘතිය හා බද්ධව ක්‍රියා කිරීමෙන් උඩරට රාජ්‍ය තතු දැනගැනීම සඳහා චරපුරුෂයකු ලෙසත් කටයුතු කරන ලදී.

එවකට රාජ්‍ය පාලන කටයුතු ගෙනයෑමේදී රජතුමා දෙබිඩි පිළිවෙතක් අනුගමනය කළේය. එක් විටක නායක්කර් ඥාතීන් තමා වෙත සමීප කරගෙන වැඩි විශ්වාසයක් තබා කටයුතු කර සූක්ෂම ව රදළ පවුල් අතර මතභේද වර්ධනය කිරීමට කටයුතු කළේය. නිදසුනක් ලෙස ඇහැලේපොළ හා මොල්ලිගොඩ අතර ඇති කළ බෙදීම පෙන්වාදිය හැකිය. රජු රදළ බලය බිඳින අතර මහජනතාවගේ ප්‍රසාදය දිනාගැනීමේ පිළිවෙතක් ගෙනගොස් ඇත. මහජනතාව තලා පෙළා කටයුතු කළ රාජ්‍ය නිලධාරීන්ට දැඩි දඬුවම් ලබාදීම, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිල පාලනය කිරීම තුළින් එකී අරමුණු සපුරාගැනීමට හැකි විය. උඩරට සමාජය දූසිරිතෙන් තොරව තබාගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා හෙතෙම සමත් විය. අත්‍යවශ්‍ය රාජකාරි කටයුතු සඳහා මහජනතාව යෙදවීමත් සමග රජුට එරෙහිව ජනතා අප්‍රසාදය ගොඩනැගුණේ ය. වලපනේ සහ සබරගමුවේ ජනතාව ඉන් වඩාත් කැපී පෙනේ.

රජු මානසික අසහනයෙන් පෙලුණු අයෙකු බවට උඩරට පුරා ප්‍රචලිත විය. තවද මත්පැන් පානයටත් කාමුක ක්‍රියාවන්ටත් ඔහු පුරුදු වූ බව පෙනේ. රජු නොසිතූ අවස්ථාවක පිළිමතලව්වේ මිනිසුන්ට අල්ලස් ලබාදී ඔහු මැරීමට කුමන්ත්‍රණය කළේය. පසුව කුමන්ත්‍රණය හෙළි වී වැරදිකරුවන්ට දැඩි දඬුවම් ලබා දුන්නේය. තවද ඇහැලේපොළ අදිකාරම් සබරගමුවේ දියත් කළ කැරැල්ල අසාර්ථක වූ බැවින් ඊට සම්බන්ධ විශාල පිරිසකට දරුණු දඬුවම් ලබා දුන්නේය. මෙවැනි සිදුවීම් නිසා උඩරට රජු කෙරෙහි ජනතා අප්‍රසාදය තවදුරටත් වර්ධනය විය.

උඩරට භේදකාරී පසුබිම පුළුල්වත් ම නව ආණ්ඩුකාරවරයා ලෙස ක්‍රි.ව. 1812 සිට රොබට් බ්‍රවුන්රිග් කටයුතු කරන ලදී. උඩරට රජුගේ පීඩාකාරී පාලනයෙන් ලංකාවේ අභ්‍යන්තරය මුදවාගැනීමට සුදුසු ම අවස්ථාව මෙය බව ආණ්ඩුකාරතුමා වටහා ගත්තේය. ක්‍රි.ව. 1814 නොවැම්බර් මාසයේ දී උඩරට රාජ්‍යයේ වෙළඳාමේ යෙදී සිටි බ්‍රිතාන්‍ය යටත් වැසියන් දසදෙනෙකුගේ අත්පා කපා, වධ හිංසා කිරීමට රජු ක්‍රියා කර ඇත. මෙම සිදුවීමෙන් කෝපයට පත් ආණ්ඩුකාරවරයා 1815 ජනවාරි 10 වැනි දින උඩරටට එරෙහි ව යුද ප්‍රකාශ කළේය. ආක්‍රමණයට මුහුණදීමට නොහැකි වූ රජු ඇතුළු පිරිස මැද මහනුවර බෝමුරේ ග්‍රාමයට පළා ගියහ. ක්‍රි.ව. 1815 පෙබරවාරි 18 වැනි දින ශ්‍රී ලංකාවේ අවසන් රජු ඇතුළු පිරිස ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමට ඉංග්‍රීසින්ට හැකි වූහ. ක්‍රි.ව. 1815 මාර්තු 02 දින අත්සන් කළ උඩරට ගිවිසුම නිසා එතෙක් මෙරට පැවති ස්වාධීනත්වය අවසන් විය.

අප මෙතෙක් සාකච්ඡා කරන ලද තොරතුරුවලින් අනාවරණය වන්නේ දීර්ඝ ඉතිහාසයකට අයත් වූ උඩරට රාජධානිය සමකාලීනව පැවති අභ්‍යන්තරික සහ බාහිර සාධක පදනම් කරගෙන පිරිහීමට සහ බිඳවැටීමට ලක්වූ බවයි. එකී කාලපරිච්ඡේදය තුළ කන්ද උඩරටට ම ආවේණික වූ දේශපාලන, ආර්ථික, සමාජ සහ සංස්කෘතික පසුබිමක් නිර්මාණය වීම ද කැපී පෙනේ.

දර්ශනපති අජිත් තල්වත්ත,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
මානවශාස්ත්‍ර හා ඉතිහාසය අධ්‍යයන අංශය,
රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ,